# දැනුම් කළමණාකරනය

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආධිපත්‍යය අනෙක් රටවල් කෙරෙහි බලපවත්වන ආකාරය පිළිබඳ වැටහීමක් බොහෝ දෙනකුට ඇතැයි කිව නො හැකි ය. එයට ප්‍රධාන හේතු වන්නේ අප වැටහීමක් ලබාගන්නේ යම්කිසි ප්‍රවාදයකට හෝ ප්‍රවාද කිහිපයකට සාපේක්ෂ ව වීමත් ඒ ප්‍රවාද බටහිර රටවල ම නිර්මාණය වීමත් ය. බටහිර රටවල නිර්මාණය වන දැනුම මගින් අපට එවැනි වැටහීමක් ලබාගත නො හැකි ය. බටහිර රටවල නිර්මාණය කෙරෙන දැනමෙහි බටහිරයන් ඒ දැනුම ඔස්සේ අප මත ආධිපත්‍යයක් යොදන බව සඳහන් නොවීම පුදුමයට කරුණක් නො වෙයි. බටහිර දැනුමෙහි ප්‍රධාන ධාරාවෙහි ඒ ආධිපත්‍යය පිළිබඳ ව කිසිවක් නොකීමට සැලසුම් කෙරී ඇතැයි කිව හැකි ය.

බටහිර දැනුමෙහි ඇති අධිපතිබව සැඟවීමට මෙන් බටහිරයෝ ඒ දැනුම ඊනියා වාස්තවික දැනුමක් ලෙස ඉදිරිපත් කරති. විශේෂයෙන් ම බටහිර විද්‍යාව ලෙස ඉදිරිපත් කෙරෙන දැනුම වඩත් ම වාස්තවික දැනුම ලෙස ඉදිරිපත් කෙරෙයි. බටහිර විද්‍යාව ලොවේ ඇති එකම විද්‍යාව ලෙස කිසිම බියක් සැකක් නැතිව ඉදිරිපත් කෙරෙන්නේ ඒ පිළිබඳ ව මතවාදයක් ගොඩ නැගීමෙනි. මේ මතවාදය අන් කිසිවක් නොව විද්‍යාවේ දර්ශනය, විද්‍යාත්මන විධික්‍රමය ආදී වශයෙන් ඉගැන්වෙන දැනුම ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි න්‍යාය පත්‍රයෙහි ප්‍රධාන අංකය වන්නේ බටහිර යටත්විජිතවාදය ය. ඒ යටත්විජිතවාදයෙහි අන්‍යෝන්‍ය ව බැඳුණු සංරචක තුනක් වෙයි. අප බොහෝ විට සඳහන් කර ඇති ආකාරයට ඒ සංරචක තුන දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ලෙස නම් කළ හැකි ය. බටහිර යටත්විජිතවාදයෙහි අවසන් අරමුණ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දේශපාලන ව්‍යූහ, ආර්ථිකය හා සංස්කෘතිය අනෙක් රටවල් මත උපක්‍රමයෙන් හෝ බලයෙන් හෝ පැටවීම ය.

මෙය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පදනම් වී ඇති ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් ලැබෙන්නකි. යුදෙව්වෝ තම සංස්කෘතිය අනෙක් ජනවර්ගවලට බොහෝ විට බලයෙන් පැටවීමට උත්සාහ කළහ. එහෙත් ඔවුහු අනෙක් ගෝත්‍රිකයන්ට යුදෙව්වන් වීමට ඉඩ නො දුන්හ. බටහිරයන් මේ ප්‍රතිපත්තිය තරමක් සංශෝධනය කර ඇති බව පෙනෙයි. අනෙක් ගෝත්‍රවල ජනයාට ද අවශ්‍ය නම් බටහිරයන් විය හැකි ය. එහෙත් එයට පළමු අනෙක් ගෝත්‍රවල ජනයා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සංස්කෘතිය වැළඳ ගත යුතු ය.

එහෙත් බටහිරයන් යුදෙව් ප්‍රතිපත්තිය මුළුමනින් ම සංශෝධනය කර නැති බව පැහැදිලි ය. යමකු හෝ යම් ජනවර්ගයක් හෝ ජාතියක් හෝ විසින් බටහිර සංස්කෘතිය හෝ බටහිර දැනුම හෝ බටහිර ආර්ථිකය හෝ වැළඳ ගත්ත ද ඒ පුද්ගලයන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සාමාජිකයන් වුව ද අනෙක් ජනවර්ගවලට හෝ ජාතියට හෝ අදාළ රටට හෝ ප්‍රධාන තැනක් හිමි නො වෙයි. උදාහරණයක් ලෙස  අද ඉන්දියාවේ හා චීනයේ සිදුවන ආර්ථික වර්ධනය ගනිමු. මේ රටවල ඇතිවන්නේ බටහිර ක්‍රමයේ ආර්ථික වර්ධනයක් බව පැහැදිළි ය. එහෙත් මේ රටවල් ආර්ථික ශක්තියෙන් යම්කිසි දවසක ඇමරිකන් එක්සත් ජනපදය අභිබවා ගිය ද, ඒ රටවලට දේශපාලන වශයෙන් හෝ සංස්කෘතික වශයෙන් හෝ ප්‍රධාන තැනක් හිමිවේ යැයි සිතිය නො හැකි ය.

අද ජපානය ඇමරිකන් එක්සත් ජනපදයට වඩා ආර්ථික ශක්තියෙන් ඉහළ ය. එහෙත් දේශපාලන වශයෙන් ජපානයට වැදගත් තැනක් හිමි නොවන්නේ එක් පැත්තකින් දේශපාලනය සංස්කෘතිය ඇතුළු සියල්ල ආර්ථික අධෝව්‍යුහය මත පදනම් වන්නේ යැයි කියන මාක්ස්වාදය බොරු කරමිනි. ආර්ථික වශයෙන් ගත්කල ඇමරිකන් එක්සත් ජනපදයට හා බ්‍රිතානියට වඩා ශක්තිමත් රටවල් ලෝකයේ තිබිණ ද, ලොවෙහි මූල්‍ය වෙළෙඳපොළෙහි මධ්‍යස්ථාන වනුයේ ලංඩන් හා නිව්යෝක් නගර ය. අරාබි රටවල තෙල් මුදල් ඇතුළු බොහෝ මූල්‍ය අරමුදල් අවසානයේ දී තැන්පත් වන්නේ ඒ නගරවල ය.

© Prof. Nalin De Silva

එයට අමතර ව ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආදිය ක්‍රියාත්මල වන්නේ ඇමරිකා එක්සත් ජනපදය මූලස්ථානය කරගනිමිනි. ඊනියා තුන්වැනි ලෝකයේ රටවල් බොහෝමයක් ණය පුඩුවෙහි සිරකර තබන්නේ මේ ආයතනවලින් දෙන උපදෙස් මඟිනි. මේ සියල්ල පසුපස ඇත්තේ කුමක් දැයි විග්‍රහකර බැලූවිට පෙනී යන කරුණ නම් බටහිරයන්ගේ දැනුම මෙහි දී ප්‍රධාන කාර්යය ඉටුකරන බව ය. ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ක්‍රියාත්මක වන්නේ බටහිර ආර්ථික හා කළමණාකරන දැනුම් පදනම් කරගනිමිනි. දැන් දැන් ආර්ථික විද්‍යාවටත් වඩා ව්‍යාපාර කළමණාකරනය, කාර්මික කළමණාකරනය හා තොරතුරු තාක්‍ෂණය වැනි විෂය වැදගත් වෙමින් පවතියි. තොරතුරු තාක්‍ෂණය යැයි කීව ද එහි දී ද වැඩි අවධාරණයක් කෙරෙන්නේ කළමණාකරනයට ය. වැඩිකල් නොගොස් දැනුම ද කළමණාකරනය වනු ඇත. කල් යැමේ දී මෙ විෂය සියල්ල කළමණාකරනය යටතේ එකතුකිරීමට ඉඩක් ඇත.

අද ලෝකය කළමණාකරනය මත පවතින්නේ යැයි කිව හැකි ය. ව්‍යාපාර කළමණාකරනය විශ්වවිද්‍යාලවල ඉගැන්වෙන ප්‍රධාන විෂයයක් බවට පත්වූයේ ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදයෙහි ය. ඒ ලෝක නායකත්වය බ්‍රිතානියෙන් ඇමරිකා එක්සත් ජනපදයට මාරුවීමත් සමග සිදු වූ එක් වෙනසකි. ඇතැමුන් පශ්චාත්නූතනත්වය යනුවෙන් හඳුන්වන්නේ ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසු මෙවැනි වෙනස්කම් සිදු වී ඇති බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ය. ඇමරිකා එක්සත් ජනපදය අනුකරනය කරමින් පසු කලෙක ලංකාව ද ඇතුළු ලෝකයේ අනෙක් රටවල කළමණාකරනය වැදගත් ම විෂයය බවට පත්වනු ඇත.

එහෙත් මේ කළමණාකරනය සිදුවන්නේ බටහිර කළමණාකරන මූලධර්ම ඔස්සේ ය. කළමණාකරනයෙහි වේවා ආර්ථික විද්‍යාවෙහි වේවා බටහිර විද්‍යාවෙහි වේවා දැනුම නිර්මාණය කෙරෙන්නේ බටහිර ය. වඩාත් නිරවුල් ව පවසන්නේ නම් ඒ දැනුම් නිර්මාණය කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. ඒ දැනුම නිර්මාණය කරන්නා ඇමරිකානු ජාතිකයකු ද චින ජාතිකයකු ද නැගෙනහිර යුරෝපීයයකු ද ඉන්දියානුවකු ද, සිංහලයකු ද යන්න වැදගත් නො වෙයි. නිර්මාපකයා කවරකු වුව ද ඒ දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිර්මාණය කෙරෙන අතර, බොහෝ විට බටහිර රටක දී නිර්මාණය වෙයි.

වර්තමානයෙහි බටහිර රටවල, විශේෂයෙන් ම ඇමරිකා එක්සත් ජනපදයෙහි ආසියාතික විද්‍යාඥයන් දක්නට ඇත. ඇතැම් විටක ඇතැම් විශ්වවිද්‍යාලයක බටහිර විද්‍යා විෂයයක ආචාර්යවරු බහුතරය ආසියාතියෝ ය. එහෙත් එයින් කියැවෙන්නේ ඒ ආසියාතික විද්‍යාඥයන් ආසියාතික විද්‍යාවක්, ආසියාතික දැනුමක් නිර්මාණය කරන බව නො වෙයි. ඔවුන් ද නිර්මාණය කරන්නේ බටහිර විද්‍යාවකි. ආසියාතික විද්‍යාඥයෝ ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ම දැනුම නිර්මාණය කරති. බටහිර රටවල වෙසෙන ආසියාතික විද්‍යාඥයන් පමණක් නොව ආසියාතික රටවල වෙසෙන විද්‍යාඥයන්ට ද ඔවුන් නව දැනුමක් නිර්මාණය කරන්නේ නම් එසේ කරන්නේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය.

මෙයින් පැහැදිලි වන කරුණ නම් අද ලෝකයෙහි චින්තන ආධිපත්‍යය බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සතු බව ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇති වී අවුරුදු පන්සියයකට වඩා ගෙවී ඇත. මේ අවුරුදු පන්සියයකට අධික කාලයෙහි දී බටහිරයන් විසින් අත්පත් කෙරී ඇති වැදගත්ම ජයග්‍රහණය වනුයේ මේ චින්තන ආධිපත්‍යය ද ඇතුළත් සංස්කෘතික යටත්විජිතවාදය ස්ථාපිත කරගැනීම ය. ආරම්භයේ දී බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ප්‍රධාන සංරචකය වූයේ දේශපාලනය ය. බටහිරයෝ තම දේශපාලන ආධිපත්‍යය යොදාගෙන පාසල් හා විශ්වවිද්‍යාල ඇතිකළහ. ඔවුන්ගේ දැනුම උපායෙන් හා බලයෙන් අනෙක් රටවල ජනතාව මත පැටවූහ. ඔවුන්ගේ දැනුම එකම දැනුම බව ප්‍රචාරය කළහ.

අද ආසියාවේ, අප්‍රිකාවේ හා දකුණු ඇමෙරිකාවේ රටවල බටහිර දැනුම ප්‍රචාරය කරන ප්‍රධානීන් බවට පත් වී ඇත්තේ ඒ ඒ රටවල උගතුන්, එනම් බටහිර උගතුන් ලෙස නම්කෙරී ඇත්තවුන් ය. යුදෙව්වන් යුදෙව් සංස්කෘතිය අනෙක් ජනවර්ග මත පැටවූ ආකාරයට බටහිරයෝ වර්තමානයෙහි බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම අනෙක් අය මත පටවති. යුදෙව්වන්ට වඩා තරමක් වෙනස් ව එසේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වැළඳ ගත්තවුන් තමන් වැනි ම වූ පිරිසක් ලෙස සලකති. එහෙත් යුදෙව්වන් තම සංස්කෘතියට ඇතුළත් වූ පුද්ගලයන් ට වැදගත් කමක් ලබා නොදුන්නා සේ ම බටහිරයෝ ද ඒ අනෙක් රටවල්වලට වැදගත් කමක් ලබා නො දෙති. මූල්‍ය වෙළෙඳ පොළ ලංඩනයේ හා

© Prof. Nalin De Silva

නිව්යෝක් නගරවල ම තව දුරටත් පවත්වගෙන යෑමට හැකි කළමණාකරනයක් ලොවට හඳුන්වා දීමට බටහිරයන් සමත් වී ඇත.

බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ආරම්භයේ දී දේශපාලනය (හමුදා බලය ද ඇතුළුව) ප්‍රධාන සංරචකය වුව ද අද වන විට සංස්කෘතික සංරචකය ප්‍රධාන සංරචකය බවට පත් වී ඇත. සංස්කෘතික යටත්විජිතවාදය ද පසුගිය අවුරුදු පනහක පමණ කාලයෙහි වෙනස් වී ඇත. එදා සංස්කෘතික සංරචකය ක්‍රියාත්මක වූයේ පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ ය. මතවාදී වශයෙන් ගත්කල විශ්වවිද්‍යාලවල වැදගත් වූයේ ශාස්ත්‍ර හා විද්‍යා පීඨ ය. එහෙත් අද ඇමරිකා එක්සත් ජනපදයේ දැනටමත් ව්‍යාපාර කළමණාකරන පීඨවලට ඒ තැන හිමි වී ඇති අතර, අනෙක් රටවල ද යථා කාලයේ දී ඒ තත්වය උදාවනු ඇත. ඒ අතර සංස්කෘතික යටත්විජිතවාදයේ ප්‍රධාන වාහකය බවට රූපවාහිණී මාධ්‍යය පත් වී ඇත. අද එක තුවක්කුවක් හෝ පත්තු නොකර බටහිර රටවල ට රූපවාහිණී මාධ්‍යය හා විශ්වවිද්‍යාල ඔස්සේ ලෝකය කළමනාකරනය කළ හැහි ය.

බටහිරයන්ගේ මේ ආධිපත්‍යය පරාජය නොකර අපට නිවහල් ව ජීවත්විය නො හැකි ය. සංස්කෘතික යටත්විජිතවාදයෙහි මුල ඇත්තේ බටහිර නිර්මාණය කරන ප්‍රවාද වෙයි. බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වූ  ප්‍රවාද අභියෝගයට ලක්කර අපේ ප්‍රවාද මගින් ඒ පරාජය කළ යුතු වෙයි. අප බටහිරයන් අතින් කළමණාකරනය කෙරෙන ඉත්තන් බවට පත්විය යුතු නො වෙයි. අවුරුදු පන්සියයකට අධික කාලයක් තිස්සේ වර්ධනය වූ දැනුම් පද්ධතියක් අවුරුදු දහයකින් පහළොවකින් පරාජය කළ හැකි යැයි නො සිතිය යුතු ය. ඒ සඳහා විශාල පිරිසකගේ දායකත්වය අවශ්‍ය වන අතර තරමක කාලයක් ද ගත වෙයි. එහෙත් දැනට ඒ සඳහා අවශ්‍ය පදනම සකස් කෙරී ඇත. ශෞතික විද්‍යවෙහි වේවා, කළමණාකරනයෙහි වේවා, සාහිත්‍ය විචාරයෙහි වේවා අපේ ප්‍රවාදවල වැදගත් කමක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva